# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 මැයි 25** **චක්‍රලේඛය** **2021 අංක 05**

## කොවිඩ් නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම

කොවිඩ්-19 ව්‍යසනයේ තෙවන ව්‍යාප්තිය හමුවේ පීඩාවට පත් ණය ගැනුම්කරුවන්/පාරිභෝගිකයන්ට සහන සැලසීම සම්බන්ධව රාජ්‍ය ආයතන හා අනෙකුත් පාර්ශව රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව කොවිඩ්-19 වසංගතයේ තෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණ පා ඇති ගැටළු සලකා බලමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) විසින් බලපෑමට ලක්වී ඇති ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) යටතේ තවදුරටත් පහත සහනයන් ලබාදීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටී. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර හා පුද්ගලයන් ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ථ ප්‍රතිලාභ අඩු නොවන අයුරින් අමතර සහන සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකු හට හැකියාව ඇත. මෙම යෝජනා ක්‍රමය සියළු බලපත්‍රලාභී බැංකු විසින් ඒකාකාරීව ක්‍රියාත්මක කරවීම සඳහා සහ ව්‍යාපාර හා ආදායම් ඉපයීමේ කටයුතු වල සිදුව ඇති ඇණහිටීම් හේතුවෙන් ණය ගැනුම්කරුවන් හට ණය වාරික ආපසු ගෙවීමේදී ඇතිවන පීඩාව ලිහිල් කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

1. **2021 මැයි 15 දින වන විට සක්‍රීයව පැවති ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම.**

(අ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා, එනම් රැකියා අහිමිවීම, ආදායම් අහිමිවීම හෝ ආදායම / වැටුප් අඩු වීම හෝ විකුණුම් අඩු වීම,ව්‍යාපාර වසා දැමීම යනාදිය සලකා බලා කොවිඩ්-19 හි තෙවන රැල්ලෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම් වල මුල් ණය මුදල හෝ පොළිය හෝ එම කොටස් දෙකම හෝ, 2021 අගෝස්තු 31 දක්වා කාලය තුළ එක් එක් අවස්ථාව අනුව අයකර ගැනීම කල් දැමීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කල යුතුය.

(ආ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ගේ රුපියල්වලින් හෝ විදේශ මුදල්වලින් ලබා දී ඇති ණය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක මුල් ණය මුදල හෝ පොළිය හෝ ඒ දෙකම ගෙවීම කල් දැමීම, එම ගනුදෙනුකරුවන් විසින් මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතා සහ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් සිදු කල යුතුය.

(ඇ) ඉහත ආපසු ගෙවීම කල්දමන ලද ඕනෑම රුපියල් ණය පහසුකමක් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් කල්දමන ලද කාල සීමාව සඳහා සහ කල්දමන ලද මුදල මත

පමණක්, 2021 මැයි 19 දින පැවති දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතය ට සියයට 1 එකතු කල අගය නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතයක් අය කළ හැකිය (එනම් 5.18% + 1% = වසරකට 6.18%). විදේශ මුදලින් ගත් ණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින්, පවත්නා අඩු පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් සහනදායී පොලී අනුපාතයක් අය කල හැක.

(ආ) විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගාසිටුවීමේ සැලැස්මක් (Revival plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව පවතින අතර, මෙහිදී, බලපත්‍රලාභී බැංකුව සහ ණය ගැනුම්කරු විසින් දැනට පවතින අඩු පොලී අනුපාතයන් සැලකිල්ලට ගනිමින් සුදුසු පොලී අනුපාතයකට එකඟ විය යුතුය.

(ඉ) 2021 මැයි 15 සිට 2021 අගෝස්තු 31 දක්වා කාලය තුලදී පියවීමට යෙදෙන, කාරක ප්‍රාග්ධන, උකස් අත්තිකාරම්, තාවකාලික අයිරා, කෙටිකාලීන වෙළඳ මූල්‍ය පහසුකම් ඇතුළු අනෙකුත් චක්‍රීය ණය පහසුකම් සඳහා පියවීමේ දින 2021 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතු අතර, ඒ සම්බන්ධයෙන් කල් තබන ලද කාලසීමාව සඳහා පොලී අයකිරීම ඉහත 1(ආ) හි සඳහන් පරිදි කල් දමන ලද මුදල මත පමණක් සිදුකල යුතුය.

(ඊ) ණය සහන කාලය තුළ, එනම් 2021 මැයි 15 සිට 2021 අගෝස්තු 31 දක්වා, දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකල යුතුය.

(උ) දැනට පවතින සංචරන සීමාවන් හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින්, ණය ආපසු ගෙවීම් නියමිත දිනය දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 10ක් දක්වා) කල් දැමීමට කෙරෙන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල්දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතු අතර, බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ එවැනි ප්‍රමාදයන් සඳහා කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තු අය නොකල යුතුය.

(ඌ) 2021 මාර්තු 13 දින නිකුත් කරන ලද 2021 අංක 03 චක්‍රලේඛය යටතේ කල්බදු (ලීසිං) පහසුකම් ආපසුගෙවීම් කල් දැමීමේ සහන බුක්ති විඳින හෝ 2021 මාර්තු 19 දින නිකුත් කරන ලද 2021 අංක 04 චක්‍රලේඛය යටතේ, ණය සහන ලබා ගත් ණය ගනුදෙනුකරුවන් ඉහත සහන සඳහා සුදුසුකම් නොලබනු ඇත.

**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**



2. **2021 මැයි 15 දිනට අක්‍රිය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා හිමිවන සහන**

(අ) ණය ලබා ගත් තැනැත්තාගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිලිගත හැකි ව්‍යාපාර නගාසිටුවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, 2021 මැයි 15 වන විට අක්‍රිය තත්ත්වයේ පවතින ණය පහසුකම්, දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව පවතින අතර, මෙහදී, පොලී අනුපාතය ඇතුළු නියමයන් හා කොන්දේසි සම්බන්ධව බලපත්‍රලාභී බැංකුව සහ ණය ගැනුම්කරු එකඟතාවයකට පැමිණිය යුතුවේ.

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලේඛනගත කිරීම සඳහා සලකනු ලබන පහසුකම් සඳහා 2020 අප්‍රේල් 1 සිට 2021 මැයි 15 දක්වා කාලය තුල එකතු කර ඇති හෝ අය කර ඇති දඩ පොලී කපා හැරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කල යුතුය.

(ඇ) බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රියෙල් 01 දින හෝ ඊට පසුව අක්‍රිය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට අදාළව සියළුම අත්පත්කර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 අගෝස්තු 31 දක්වා අත්හිටුවිය යුතුය.

3. බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන ලබා දීමේදී අධික ගාස්තු හෝ අයකිරීම් එකතු නොකළ යුතුය.
4. රුපියල් 500,000 ට අඩු චෙක්පත් වලංගු කාලය 2021 ජුනි 30 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කල යුතුය.
5. බලපත්‍රලාභී බැංකු විසින් 2021 ජුනි 30 දක්වා කාලය තුල සියළු චෙක්පත් ගනුදෙනු සම්බන්ධයෙන් අගරුවූ චෙක්පත් සහ චෙක්පත් ගෙවීම් නතර කිරීම් සඳහා ගාස්තු අයකිරීමෙන් වැලකිය යුතුය.
6. පැහැදිලිවම පීඩාවට පත් ගනුදෙනුකරුවන් සඳහා, 2021 ජුනි 30 දක්වා කාල සීමාව තුල, ණය කාඩ්පත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීම අත්හිටුවීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කටයුතුකල යුතුය.
7. පවත්නා ණය පහසුකම/පහසුකම් කල්දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවට, ණය ගනුදෙනුකරුවෙකු විසින් ඔහුගේ/ඇයගේ පවත්නා ණය පහසුකම් 2021 අගෝස්තු 31 දිනට හෝ ඊට පෙර පියවා අවසන් කිරීමට ඉල්ලාසිටී නම් එවැනි පහසුකම් සඳහා කිසිදු පූර්ව පියවීමේ ගාස්තුවක් අයකිරීමෙන් වැලකී සිටීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතුය.

## 8. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(අ) බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු (CRIB) වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැලකිය යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල්දැමීම්/ප්‍රතිව්‍යුහගත කිරීම් වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡාකොට සකස්කල යුතු වේ.

## 9. ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය

(අ) ඉහත ණය සහන සඳහා සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් 2021 ජුනි 21 දිනට හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් සිය ඉල්ලීම් අදාල බැංකු වෙත යොමු කලයුතු අතර, බලපත්‍රලාභී බැංකු විසින් මෙම ණය සහනයන්, අයදුම් කල හැකි අවසාන දිනය සහ අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකෘතිය ආදී තොරතුරු සුදුසුකම් ලත් සියලුම ණය ගනුදෙනුකරුවන් වෙත විද්‍යුත් තැපැල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත හා/හෝ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ කඩිනමින් සන්නිවේදනය කළ යුතුය.

(ආ) පිළිගත හැකි හේතු සහිතව 2021 ජුනි 21 න් පසුව වුවද කරනු ලබන ඕනෑම ඉල්ලීමක් සලකා බැලීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව ඇත.

(ඇ) සුදුසුකම් ලද මුත් ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති ණය ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් කල්දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අයදුම් කිරීම වෙනුවට ණය ආපසු ගෙවීම් සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) මෙම ණය සහන සඳහා අයදුම් කරනු ලබන ණය ගනුදෙනුකරුවන් ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර අදාල ණය පහසුකම් කල්දැමීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර, එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ දී ද, ඒ සඳහා හේතු පැහැදිලිව සඳහන් කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතුය.

**10. ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම් තැබීම**

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන කාලසීමාවට අදාලව ගිණුම්තැබීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ඔක්තෝබර් 28 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය අනුව කටයුතු කල යුතු අතර, මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා බලපත්‍රලාභී බැංකු හට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

**11. වාර්තාකරණ අවශ්‍යතා**

බලපත්‍රලාභී බැංකු විසින් 2021 ජුනි 30 වන දින සිට වැඩකරන දින 15 ක් ඇතුළත, සෑම මසකම 30 වනදින වන විට තම ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගත් සහන පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කල යුතු අතර, අදාළ වාර්තාකරණ ආකෘති බලත්‍රලාභී බැංකු වෙත ඉදිරිකාලයේදී යොමු කරනු ඇත.

*අත්සන් කලේ*

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**
*මුදල් මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*